WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

## ගෘහ ආර්ථික විද්‍යාව II

* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ආහාර සුරක්ෂිතතාව, ආහාර පරිභෝජන රටාව, නිවාස ප්‍රශ්නය, දරුවන්ගේ රැකවරණය සහ ඇඳුම් විලාසිතා වර්තමානයේ දී සමාජය තුළ විශේෂ අවධානයට බඳුන් වී ඇති කරුණු කිහිපයකි. මෙම කරුණු ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට ඇතුළත් විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධ ය. සිසුහු කණ්ඩායම් වශයෙන් ඉහත සඳහන් කරුණු පිළිබඳ ව ව්‍යාපෘති මගින් අධ්‍යයනය කරති. එමගින් ඔවුහු මෙම කරුණු හා සම්බන්ධ ව යහපත් තීරණ ගැනීමට අවශ්‍ය නිපුණතා ලබා ගනිති.

(i) ගබඩා කිරීමේ දී ආහාරවල ගුණාත්මක ලක්ෂණ පවත්වා ගැනීමට බාධා ඇති කරන සාධක **දෙකක්** ලියන්න.

(ii) මනාව ඇසුරුම් කිරීමෙන් ආහාරවල සුරක්ෂිතතාව රැකගත හැකි වේ. ඇසුරුම් සඳහා භාවිත කරන ද්‍රව්‍ය **හතරක්** සඳහන් කරන්න.

(iii) ක්ෂණික ආහාර පරිභෝජනය **නුසුදුසු** වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(iv) උදේ ආහාරය නොගැනීම නිසා පාසල් දරුවන්හට ඇති වන **අහිතකර** ප්‍රතිඵල **දෙකක්** ලියන්න.

(v) ඇඳුම් සඳහා මෝස්තර නිර්මාණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **දෙකක්** ලියන්න.

(vi) ඇඳුමක මනා නිමාව කෙරෙහි බලපාන කරුණු **හතරක්** සඳහන් කරන්න.

(vii) දරුවන් අනතුරුවලින් වළක්වා ගැනීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් සංවිධානය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** ලියන්න.

(viii) මුල් ළමාවිය දරුවන් තුළ යහපත් පුරුදු ඇති කරවීමෙහි ලා දෙමව්පියන් විසින් ගත යුතු පියවර **දෙකක්** ලියන්න.

(ix) නිවසක් සැලසුම් කිරීම සඳහා භූමිය තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(x) නගරාශ්‍රිතව නිවාස ප්‍රශ්නය උග්‍ර වී ඇත. මෙය අවම කර ගැනීම සඳහා ජාතික මට්ටමින් ගෙන ඇති පියවර **දෙකක්** ලියන්න.

**2.** (i) (a) ළදරු ඇඳුමක් (Baby Shirt) නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** ලියන්න.

(b) ළදරු ඇඳුම් පන්නයක් සඳහා සුදුසු පතරොමක් අඳින්න.

(ii) බිත්ති සැරසිල්ලක අද්දර අලංකාර ලෙස නිම කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම **දෙකක්** නම් කරන්න. ඉන් **එක්** ක්‍රමයක් පැහැදිලි කරන්න.

**3.** (i) තෙත් තාපය මගින් පිසීමේ ක්‍රම **තුනක්** නම් කරන්න. ඉන් **එක්** ක්‍රමයක් උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) පහත දැක්වෙන දෑ හඳුන්වන්න.

ආහාර පිළියෙල කිරීමේ දී,

(a) පදම් කිරීම (marinating)

(b) පැසීම (fermentation)

(iii) ආහාර පිරමිඩය, නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහන සහ පෝෂණ වගුව ආහාර වේල් සැලසුම් කිරීමේ දී උපයෝගී කර ගන්නා මූලාශ්‍ර වේ. ආහාර වේල් සැලසුම් කිරීමේ දී මින් **දෙකක්** වැදගත් වන අයුරු පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. (i) පොලිසැකරයිඩ **තුනක්** නම් කර, ඒ එකිනෙක අඩංගු ආහාර ද්‍රව්‍යය බැගින් ලියන්න.

(ii) පරිභෝජනය සඳහා තිබූ කිරි සහ පාන්වල පහත දැක්වෙන වෙනස්වීම් සිදුව තිබුණි.

- කිරි ඇඹුල් රසවීම
- පාන් පෙතිමත කළු පැහැවීම

මේ එකිනෙකට හේතුව දක්වන්න.

(iii) ගර්භිණී මවකට උදේ ආහාර වේලක් සඳහා බොජුන් පතක් සැලසුම් කරන්න. මෙම ආහාර වේලෙහි එකිනෙක ආහාර ඇතුළත් කිරීමට හේතු දක්වන්න.

5. (i) නිවසේ දී ජලය අරපිරිමැස්ම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.

(ii) පහත සඳහන් නිර්ණායක සැලකිල්ලට ගනිමින් නිදන කාමරයක් සඳහා පරිමාණයට අනුව බිම් සැලසුමක් අඳින්න.

- කාමරයේ ප්‍රමාණය - 12' × 10'
- අඩි 10 බිත්තියෙහි පියන් තුනක ජනේලයක් ඇත.
- අඩි 12 බිත්තියෙහි දොර පිහිටා ඇත.

(iii) නිවෙස් අලංකරණයේ දී ගෙවත්ත මනාව සංවිධානය කර ගත හැකි අයුරු සාකච්ඡා කරන්න.

6. (i) මාතෘ සායනයක දී ගර්භිණී මවක් රුධිර පරීක්ෂණයට භාජනය කරනු ලබයි. මෙම පරීක්ෂණයෙන් අනාවරණය කර ගනු ලබන කරුණු **තුනක්** සඳහන් කරන්න.

(ii) "නව යොවුන්විය තුළ ශීඝ්‍ර සමාජයීය වර්ධනයක් පෙන්නුම් කරයි." විමසන්න.

(iii) (a) මුල් ළමාවියෙහි දරුවන් පිළිබිඹු කරන චර්යාමය ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(b) ඉන් **එකක්** ඇතිවීමට හේතු හා මඟහරවා ගැනීමට ගතයුතු පියවර සාකච්ඡා කරන්න.

7. (i) සටහන් ලියන්න.

පූර්ව ප්‍රසව සංවර්ධනය හා සම්බන්ධ,

(a) සංසේචනය

(b) අධිරෝපණය

(ii) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක, දරුවන්ගේ ගණිත සංකල්ප සාධනය සඳහා ක්‍රියාකාරකම් ගොඩනගා ඇත. **එක්** ගණිත සංකල්පයක් සාධනය සඳහා ඉවහල් කර ගන්නා ක්‍රියාකාරකමක් පැහැදිලි කරන්න.

(iii) නව යොවුන්වියෙහි ඇති වන ද්විතීයික ලිංගික ලක්ෂණ සාකච්ඡා කරන්න.

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...